# ගුම්භිය ජාතකය

තවද ශාස්තෘවූ තිලෝගුරු බුදුරාජනන් වහනසේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි උකටලිවූ භික්ෂුකෙණෙකුන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලද.

ඒ කෙසේද යත්

භික්ෂුකෙණෙකුන් වහන්සේ ස්ත්‍රියක් නිසා උකටලී ව වාසය කරණ සේක. සර්වඥයන් වහන්සේ එපවත් දැන වදාරා සැබෑද මහණ තා ස්ත්‍රියක් නිසා උකටලීවිම්යි කීසේක. සර්වඥයන් වහන්සේ එම්බල මහණ ස්ත්‍රීන් කෙරේ උකටලී වීම නම් ගුම්භිය නම් රාජක්ෂයා මගසලා තුබූ මී මෙනැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්පුරුකෙකෙුන් රාජ්ජය කරණ සමයෙහි බෝධිසත්වයන් වහන්සේ වෙළඳ ව ඉපිද පන්සියයක් ගැල්පුරා බඩුගෙණ වෙළදාමට යන්නාහු මනුෂ්‍යයන්ට බෝධිසත්වයෝ කියන්නාහු මංවල මී මුළු ආදීවූ දෙයක් නොකෑ විරු එළජාතිත් මා විචාරා විනා කවුරුත් නොකවයි කියා වනාන්තරයට වන්නාහ. ගුම්භිය නම් රාක්ෂයා මී සලා මුළු වල බැඳ මගතබා තෙමේ පොරවක් ඇරගෙණ මී කොටමින් බැද්දේ සිටියේය. මනුෂ්‍යයෝ පුරුෂයෙකුගේ සැදහැ යහපතැයි කියමින් ම මුළු ඇරගෙණ කන් නටවන්හ. බෝධිසත්වයන් මා විචාරා විනා නොකවයි කීයද්දී මී මුළු කන්ට වන්කලට බෝධිසත්වයෝ ඒ දැක කමින් සිටිම් උගුරු අල්වාගෙණ දැමුහ. අතින්ගත් මී අතින් දැමුහ. පළමු කෑ අය නැසුනාහ. යන්තමක් කෑ අය බෙහෙත් පොවා නංවාපුවාහ. එකියන්නාවූ අර්ථය දකවන සර්වඥයන් වහන්සේ වදාරණසේක් ගුම්භිය රාක්ෂසයා මනුෂ්‍යයන් මරන්ට මී සලා මුළුබැඳ තිබීද එමෙන්ම මනුෂ්‍යයෝ අනුවනින් මිකා මළහ. සමහර නුවනැති මනුෂ්‍යයෝ නොකා නොකෑ විසින් සුවපත්වූහ. මනුෂ්‍යන්ට රාගචේතනාව නම් මාත්‍රුමාරයා විසින් ලාළුවාවූ මලක්හාද බලියක්හාද සමාන වන්නේය. පඤ්චකාමයට අසුවුනු කෙණෙක් ඇත්නම් මළවුන් හා සමානයයි වදාරා චතුසත්‍යය ප්‍රකාශකොට මේ ගුම්භිය ජාතකය නිමවා වදාළසේක. චතුරාර්ය සත්‍යාවසානයෙහි උකටලී භික්ෂූන් වහන්සේ සෝවාන් වූසේක. එසමයෙහි සාන්තුනායක වෙළඳ ව උපන්නෙම් බුදුවූ මම්ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළ සේක.